කලාප අධ්‍යාපන දෙපාර්තමේන් ... ත්නපුර කලාප අධ්‍යා කලාප අධ ක
Zonal Education Department ... ura Zonal Education ducationvith
කලාප අධ්‍යාපන දෙපාර්තමේන් ... ත්නපුර කලාප අධ්‍යා කලාප අධ්‍යා

**කලාප අධ්‍යාපන කාර්යාලයය- රත්නපුර**

# අවසාන වාර පරීක්ෂණය - 2008

## 10 වන ශ්‍රේණිය                කාලය පැය 01

කලාප අධ්‍යාපන දෙපාර්තමේන්තුව ර ... ාපන දෙපාර්තමේන්තුව රත්නපුර කලාප අධ්‍යා විත
Zonal Education Department Ratna ... tment Ratnapura Zonal Education ducation Zoí
කලාප අධ්‍යාපන දෙපාර්තමේන්තුව ර ... ාර්තමේන්තුව රත්නපුර කලාප අධ්‍යා විතානගේ


**සෞන්දර්ය අධ්‍යාපනය - චිත්‍රකලාව i**

ලකුණු 40

**මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු ලියන්න.**

නම:-.................................................... පන්තිය:-.........................................

**පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කොටගෙන අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**



01. මෙම සිතුවම ----------------------------- විහාරස්ථානය තුල දක්නට ලැබෙන සිතුවමකි.
02. මෙම සිතුවමින් නිරූපනය වන්නේ --------------------------------------------------------------- ලක්දිවට පැමිණි ආකාරයයි.
03. මෙම සිතුවම නිර්මාණය කරන ලද්දේ ------------------------------------- ශිල්පියා විසිනි.
04. මෙම සිතුවම තුල ---------------- -------------- ------------ ආශ්‍රිත වර්ණ මාලාවක් දැකිය හැකිය.
05. ---------------------------------------------------------------------------- මෙම ශිල්පියාගේ සිතුවම් තුළ දැකිය හැකි සුවිශේෂි ලක්ෂණයක් වේ.

**අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වල කෙටි පිළිතුරු සපයන්න.**

06. සංඝරාජ පදවි පිරිනැමීම නැමති චිත්‍රය දැකගත හැකි වන්නේ කුමන විහාරස්ථානයක ද?
---------------------------------------------------------------------------
07. "සඳ පායා " නැමති චිත්‍රය කුමන චිත්‍ර ශිල්පියකුගේ කලා කෘතියක් ද? ---------------------------
08. ගෝතමී විහාරයේ බිතු සිතුවම් නිර්මාණය කල කලා ශිල්පියා කවරෙක් ද?
-------------------------------------------------
09. ලියනාඩෝ ඩාවින්චි නැමති ශිල්පියා උපත ලද්දේ ඉතාලියේ ෆ්ලොරන්ස් නුවර කුමන ප්‍රදේශයකද? ----- -----------------------------------------------
10. ශ්‍රී දළදා මැදුරේ පත්තිරිප්පුව නිර්මාණය කල ශිල්පියා කවරෙක් ද? -------------------------------


ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති රූප සටහන් වලට වඩාත් ගැලපෙන රූපය **E, F, G, H, I** රූප සටහන් ඇසුරෙන් තෝරා එයට අදාළ ඉංග්‍රීසි අකුර ප්‍රශ්නය සමග ඇති තිත් ඉර මත ලියන්න.

11



(.......................)

**E**



12



(.......................)

**F**



13




(.......................)

**G**



14



(.......................)

**H**




15



(.........................)

I



**ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල හිස්තැන් පුරවන්න.**

16. මයිකල් ආන්ජිලෝ නැමති ශ්‍රේෂ්ඨ කලා කරුවා විසින් නිර්මාණය කරන ලද ඩේවිඩ් ප්‍රතිමාව ------------------------------------------------ මාධ්‍යයෙන් නිමවා ඇත.
17. ඉතාලියේ ප්‍රබුද්ධ යුගයේ විසූ ශිල්පීන් අතුරින් මැඩෝනා චිත්‍ර වැඩි ප්‍රමාණයක් සිතුවම් කර ඇත්තේ ------------------------------------------------------------ ශිල්පියා විසිනි.
18. "බුදුන් වහන්සේ මහියංගනයට වැඩීම" නැමති සිතුවම දක්නට ලැබෙන්නේ ------------------------------------ විහාරස්ථානයේය.
19. " කාන්තාව සහ කැඩපත " නැමති කලා කෘතිය ------------------------------- කලා ශිල්පියාගේ නිර්මානයකි.
20. කලා කෘති අතර මිසරයේ අමර්ණ යුගයේ විසූ පිවිතුරුම කාන්තාවගේ රුව වන්නේ ---------------------------------------- රාජනියගේ රුවයි.

**ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා වාක්‍ය වල වැරදි නම් (x) ලකුණද නිවරදි නම් (√) ලකුණද ඉදිරියේ ඇති තිත් ඉරමත සඳහන් කරන්න.**

21. ලියනාඩෝ ඩාවින්චි ශිල්පියා චිත්‍ර ශිල්පියෙකු, ගෘහ නිර්මාණ ශිල්පියෙකු, ඉංජිනේරු ශිල්පියෙකු හා සංගීතඥයෙකු වශවෙන්ද ලෝක ඉතිහාසයට එක්වේ. (---------)
22. දඹුළු ලෙන් විහාරය ක්‍රි ව. 1 වන සියවසේදී වට්ටගාමිණී අභය වළගම්බා රජු විසින් කරවන ලද්දකි. (---------)
23. මිසරයේ හමුවන ස්ක්‍රයිබ් මූර්තිය සිංහ ශරීරයෙන් සහ මිනිස් මුහුණකින් යුක්තය. (----------)
24. ග්‍රීක සාහිත්‍යය අනුව හර්මීස් යනු ප්‍රේමයට අධිපති දෙවියාය. (---------)
25. එම් හර්ලිස් ශිල්පියා කොළඹ යුගයට අයත් බටහිර තාත්වික චිත්‍ර කලා සම්ප්‍රදායට අනුකූල බෞද්ධ සිතුවම් ඇඳි ශිල්පියෙකි. (----------)

**ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති රූප A, B, C, D, E, සටහන් හඳුනාගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**A**



**B**



**C** **D**





26. A රූප සටහන අනුව එම කලා කෘතිය නිර්මාණය කල ශිල්පියා සඳහන් කරන්න

27. B රූප සටහනකින් පෙන්නුම් කරන එක් ගති ලක්ෂණයක් ලියන්න

28. C රූප සටහනින් දැක්වෙන කලා කෘතිය ශිල්පියා හඳුන්වන්නේ කුමන නමකින් ද?

29. D රූප සටහනින් දැක්වෙන කලා කෘතිය නම් කරන්න

30. E රූප සටහනින් පෙන්නුම් කරන්නේ කුමක් ද?

පහත දැක්වෙන වචන වල අර්ථය පැහැදිලි වන සේ වාක්‍යකින් සඳහන් කරන්න.

31. ටැම් පිට විහාර

32. පර්යාලෝකය

33. ස්ථපතිරායර්

34. මකර තොරණ

35. කුරුළු අඩයම චිත්‍රය

පහත දැක්වෙන කලා කෘතිය හඳුනාගෙන එය ඇගයීම පිණිස වාක්‍ය පහක් ලියන්න. ශිල්පියා, තේමාව, ශෛලිය, වර්ණ ඔහුගේ වෙනත් කෘති මෙයට ඇතුලත් විය යුතුය

36. ..........................................................................................

.

37. ..........................................................................................

38. ..........................................................................................

39 ..........................................................................................

40. ..........................................................................................

## අවසාන වාර පරීක්ෂණය - 2008
## චිත්‍ර කලාව
### 10 ශ්‍රේණිය –III පත්‍රය

කාලය පැය 02 ලකුණු 30

**අ කොටසින් හෝ ආ කොටසින් එක් චිත්‍රයක් පමණක් තෝරා ගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මානය කරන්න.**

**"අ " කොටස - ප්‍රකාශන චිත්‍ර**

01. ගොයම් කපන ගොවි ගෙවිලියෝ
02. ධීවර ගම්මානයක් (ක්‍රියාකාරී මිනිස් ඉරියව්)
03. උත්සව අවස්ථාවක් (ප්‍රීතිමත් බව පෙන්නුම් කළ යුතුවේ)
04. ඔබ පාසලට එන අවස්ථාවේ දුටු රිය අනතුරක දර්ශනයක්
05. ආගමික වතාවත්වල යෙදෙන බැතිමතුන් පිරිසක්

**"ආ" කොටස - මෝස්තර නිර්මාණය**

06. නාට්‍යමය අවස්ථාවක් සඳහා භාවිතා කළ හැකි හාස්‍ය ජනක වෙස් මුහුණක් නිර්මාණය කරන්න.
07. ළමා ඇඳ ඇතිරිල්ලක් සඳහා සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
08. ඔබ දන්නා ළමා කවියට සුදුසු සන්හි දර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
09. "ගමරාල දෙව් ලොව ගිය හැටි" කතාන්දරය ආශ්‍රයෙන් සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
10. "පරිසරය සුරකිමු" අර්ථය විදහා දැක්වෙන සේ පෝසටර් චිත්‍රයක් නිර්මාණය කරන්න.

## චිත්‍ර කලාව
### 10 ශ්‍රේණිය –II පත්‍රය

කාලය පැය 02 ලකුණු 30

ඔබ ඉදිරියේ තබා ඇති පහත දැක්වෙන ද්‍රව්‍ය සමූහය නිදහස් අධ්‍යයනයක යෙදෙන්න
පලමු චිත්‍රය දල රේඛා සටහනක්ද දෙවන චිත්‍රය ත්‍රිමාණ ලක්ෂණ පර්යාලෝකය ඝනත්වය සහ එක් ගතිලක්ෂණ පෙන්වමින් වර්ණ චිත්‍රයක් විය යුතුය.
වීදුරු බෝතලයක්, මල් සහිත අත්තක් , ඝණකයක් , පොල් ගෙඩියක්

# චිත්‍ර කලාව

## 10 ශ්‍රේණිය –I පත්‍රය

## පිළිතුරු

01. කැළණි
02. හේමමාලා සහ දන්ත කුමරු දන්ත ධාතුන් රැගෙන ඒම.
03. සෝලියස් මෙන්ඩිස් ශිල්පියා
04. කහ, රතු, දුඹුරු, ආශ්‍රිත වර්ණ මාලාවක්
05. පර්යාලෝකය, ත්‍රිමාන් ලක්ෂණ
06. කැළණි විහාරය
07. එම්.ඒ.කරුණාරත්න ශිල්පියා
08. ජෝජ් කීට්
09. වින්චි නම් ගමේ
10. දේවේන්ද්‍ර මූලාචාරී
11. I
12. H
13. E
14' F
15. G
16. කිරිගරුඬ
17. රෆායල් සෙන්සියෝ ශිල්පීන්
18. කැළණි
19. ජෝජ් කීට්
20. නෙෆර්ටිටි රාජනිය
21. (√)
22. (√)
23. (x)
24. (√)
25. (√)
26. සෝලියස් මැන්ඩිස් ශිල්පියා
27. පර්යාලෝකය/ත්‍රිමාණ බව
28. නායිකා
29. ලියනාඩෝ ඩාවින්චි ශිල්පියා
30. ආදම් මැවීම
31. කණු මත ඉදිකරන ලද විහාර
32. දුර සහ ලඟ පෙන්වීමේදී දඟරය විශාල ලෙසටත් දුරදී රූප කුඩාවන මේ ඇඳීමේ ලක්ෂණය
33. ලංකා තිලක විහාරය ගොඩ නැගීමේදී මූලික කටයුතු කල ශිල්පියා වේ
34. මහනුවර යුගයේ බුදු පිළිම හිසට උඩින් මෙවන් තොරණ නිර්මාණය දැක ගත හැකිය. මකරුන් දෙදෙනකු එක්තැන් වන ස්ථානයේ කිහිවේ මුහුණත් යොදා නිර්මාණය කර ඇත
35 මිසර චිත්‍ර අතර අගනා කෘතියකි. ඉංට්ට් නැමති වංශාධිපතිවරුන්ගේ සොහොන් කොතේ දක්නට ඇති වංශාධිපතිවරයෙකු ඔරුවක නැගී පැසිරස් වීදුරු අතරින් කුරුළු දඩයමක යෙදෙන අයුරු නිරීපනය වේ.
36. ජෝජ් කීට් චිත්‍ර ශිල්පියාගේ කෘතියකි
37. මව සහ දරුවා නිරූපනය වේ
38. මොහු විසින් විවිධ තේමා යටතේ චිත්‍ර නිර්මාණය කර ඇත ( ළමයා සහ සරුංගලය, ප්‍රේමා, කාන්තාව සහ කුරුල්ලා අනෙකුත් චිත්‍ර)
39. රේඛාව , රිද්මය වර්ණ සංයුතිය ආශ්‍රිත නවතම ශිල්ප ක්‍රම භාවිතා කර ඇත.
40. ජාත්‍යන්තර කීර්තියට පත් කල් සායම් චිත්‍ර ශිල්පියෙකි. චිත්‍ර කලාව නව ආරකට යොමු කල ශිල්පියෙකු වේ. .................... හා .......................... වැනි ශිල්පීන්ගේ ආභාෂය ලබාගෙන චිත්‍ර ඇඳ ඇත.